## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (ගෞරව) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2024

2026 - අප්‍රේල්

## BCOM 18055 – ව්‍යවසායකත්වය

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : පහයි (05) කාලය : පැය 03 යි

ප්‍රශ්න පහටම (05) පිළිතුරු සපයන්න.

---

### ප්‍රශ්න අංක 01

අ.) සාර්ථක ව්‍යවසායකයකුගේ ලක්ෂණ සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුරේ, මෙම ලක්ෂණ නව ව්‍යාපාරයක සාර්ථකත්වයට කෙසේ දායක වන්නේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ.) ශ්‍රී ලංකා ආර්ථිකයට ව්‍යවසායකත්වයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

### ප්‍රශ්න අංක 02

මධ්‍යම ප්‍රමාණයේ ශ්‍රී ලාංකික ආහාර නිෂ්පාදන සමාගමක සේවකයන් නව අදහස් බෙදාගැනීමට කැමැත්තක් නොදක්වයි. බොහෝ කළමනාකරුවන් පුරුදු ක්‍රමයන්ට පමණක් ඇලුම් කරන අතර, නිෂ්පාදන සහ ඇසුරුම්කරණය නිරන්තරයෙන් වැඩිදියුණු කරන තරඟකරුවන් වෙත පාරිභෝගිකයන් මාරුවෙමින් පවතී.

අ.) ව්‍යවසායකත්ව සන්දර්භය තුළ අවස්ථාව, නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදනය යන සංකල්ප පැහැදිලි කර, ඒවා එකිනෙක සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ.)සංවිධානයක් සේවාස්ථානය තුළ නවෝත්පාදනය ප්‍රවර්ධනය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

### ප්‍රශ්න අංක 03

තරුණ ව්‍යවසායිකාවක් පරිසර හිතකාමී ඇසුරුම් නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සැලසුම් කරයි. ඇයට තම ඉතිරිකිරීම් ආයෝජනය කිරීමට පෙර, එම අදහස ප්‍රායෝගිකද, වෙළඳපොළට සුදුසුද, සහ මූල්‍යමය වශයෙන් කළ හැකිද යන්න ඇගයීමක් කිරීමට අවශ්‍ය වේ. එසේම, ආයෝජකයන්ට සහ ව්‍යාපාරික හවුල්කරුවන්ට ඉදිරිපත් කළ හැකි ලේඛනයක්ද සකස් කිරීමට බලාපොරොත්තු වේ.

ඇ.) සම්පූර්ණ ශක්‍යතා විශ්ලේෂණයක ප්‍රධාන සංරචක සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ.) ව්‍යාපාර සැලැස්මක අරමුණ පැහැදිලි කර, නිවැරදි ව්‍යාපාර සැලැස්මකට අඩංගු විය යුතු ප්‍රධාන කොටස් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

නව ව්‍යාපාරයක් දේශීය හා සංචාරක වෙළඳපොළ සඳහා අතින් සාදන ලද ඖෂධීය සුවතා නිෂ්පාදන ඉදිරිපත් කරයි. ව්‍යාපාරය වටිනාකම නිර්මාණය කරන්නේ, ගනුදෙනුකරුවන් වෙත ළඟාවන්නේ, ආදායම උපයන්නේ සහ විශ්වාසය පවත්වාගන්නේ කෙසේද යන්න පිළිබඳව හිමිකරු තීරණය කිරීමට උත්සාහ කරයි. ඒ සමඟම, සත්‍යවාදී ප්‍රචාරණය, සැපයුම්කරුවන්ට සාධාරණ ලෙස සැලකීම සහ පාරිභෝගිකයන්ට ආරක්ෂිත නිෂ්පාදන සැපයීමද අවශ්‍ය වේ.

ඇ.) ව්‍යාපාර ආකෘතිය යනු කුමක්ද? ව්‍යාපාර ආදර්ශයක් මඟින් ව්‍යාපාරයක් වටිනාකම නිර්මාණය කිරීම කෙසේ සිදු කරන්නේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ.) ව්‍යාපාර ආචාරධර්ම සාකච්ඡා කර, ව්‍යාපාරවල දිගුකාලීන සාර්ථකත්වය සඳහා ආචාරධර්මවල වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

නව ව්‍යාපාරයක් ශ්‍රී ලංකාවේ අඩු වියදම් හෝටල් ක්ෂේත්‍රයට පිවිසීමට අදහස් කරයි. ආරම්භකයන්ට කර්මාන්ත පරිසරය තේරුම් ගැනීම, තරඟකරුවන් හඳුනා ගැනීම සහ ව්‍යාපාරය ආරම්භක අවධියේ සිට වර්ධන අවධිය දක්වා මූල්‍යමය වශයෙන් තිරසාර කරගන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට අවශ්‍ය වේ.

ඇ.) උදාහරණ සහිතව කර්මාන්ත විශ්ලේෂණය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ඇ.) ආරම්භක ව්‍යාපාරයක් සඳහා අරමුදල් මූලාශ්‍ර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**